# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2016

## Primary Piriven Year End Term Test - 2016

### 3 වසර / Grade 3

සියලු ම හිමිකම් ඇවිරිණි)
All Rights Reserved)

ඉතිහාසය
**History**

කාලය : පැය තුනයි
Time : Three hours

❖ **I වන කොටසේ සියලු ම ප්‍රශ්නවලටත්, II වන කොටසින් තෝරා ගත් ප්‍රශ්න හතරකටත් පිළිතුරු සපයන්න.**

## I කොටස

**01 නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.**

i ඉන්දියාවේ බිහි වූ පැරණිත ම විශ්ව විද්‍යාලයක් වන්නේ, ..............................................................

ii "භාණක" යනුවෙන් හැඳින් වූ භික්ෂූන් වහන්සේට පැවරී තිබුණේ, ..............................................................

iii ලංකාවේ ප්‍රධාන ඓතිහාසික වංසකථාව වන්නේ, ..............................................................

iv කෝට්ටේ යුගයේ පැවති ප්‍රධාන පිරිවෙනකි, ..............................................................

v "ෂඩ් භාෂා පරමේශ්වර" නමින් හැඳින් වූ භික්ෂූන් වහන්සේ වූයේ, ..............................................................

vi ජාතික ගීයේ නිර්මාතෘවරයා වන්නේ, ..............................................................

vii අක්ෂර භාවිත කරනු ලැබූ ශිෂ්ටාචාරය වන්නේ, ..............................................................

viii අනුරාධ අමාත්‍යවරයා පිහිටුවාගත් ජනාවාසය වන්නේ, ..............................................................

ix ලංකාවේ දිග ම ගංගාව වන්නේ, ..............................................................

x සීගිරිය තම පාලන මධ්‍යස්ථානය ලෙස තෝරා ගත් රජතුමා වන්නේ, ..............................................................

( විජය අමාත්‍යවරයා, මහවැලි ගඟ, පළමුවන කාශ්‍යප රජු, ආනන්ද සමරකෝන්, තොටගමුවේ රාහුල හිමි, කැරගල පද්මාවතී, ත්‍රිපිටකය කටපාඩමින් ගෙන ආ භික්ෂූන්, මහාවංසය, මෙසපොතේමියාව, නාලන්ද )

(ලකුණු 2×10=20)

The National e-learning Portal for The General Education

## II කොටස

**02** i. මහාවංසයේ මුල් කොටස රචනා කරන ලද්දේ කවුරුන් විසින් ද ?
ii. අනුරාධපුරයේ දක්නට ලද ප්‍රධාන පිරිවෙන් දෙකක් ලියන්න.
iii. කෝට්ටේ යුගයේ පිරිවෙන්වල පැවති අධ්‍යාපනය පිළිබඳව කෙටි හැඳින්වීමක් කරන්න.

(ලකුණු 4+6+10=20)

**03** i. මහා බෝධි සමාගම ආරම්භ කරන ලද්දේ කවරෙකු විසින් ද ?
ii. මැතක දී ආරම්භ කරන ලද විද්‍යෝදය, විද්‍යාලංකාර පිරිවෙන් දෙකෙහි නිර්මාතෘවරු නම් කරන්න.
iii. වැලිවිට සංඝරාජ ස්වාමීන් වහන්සේගෙන් සිදු වූ ශාසනික සේවාව විස්තර කරන්න.

(ලකුණු 4+6+10=20)

**04** i. ජාතික පුෂ්පය නම් කරන්න.
ii. ජාතික කොඩිය නිර්මාණය කළ කමිටුවේ දෙදෙනෙකු දක්වන්න.
iii. ජාතික කොඩියේ කොළ පාටින්, තැඹිලි පාටින්, බෝපත්වලින් හා සිංහයාගෙන් සංකේතවත් වන්නේ කුමක් ද යි දක්වන්න.

(ලකුණු 4+6+10=20)

**05** i. ගංගා නිම්න ආශ්‍රිතව බිහි වූ ආදි ශිෂ්ටාචාර දෙකක් දක්වන්න.
ii. දින 360 දින දර්ශනය දක්නට ලැබෙන්නේ කවර ශිෂ්ටාචාරයක ද?.
iii. මොහෙන්ජොදාරෝ හා හරප්පා යන නගර දෙකෙහි පැවති නාගරික ලක්ෂණ පිළිබඳ ව විස්තරයක් කරන්න.

(ලකුණු 4+6+10=20)

**06** i. "ඉතිහාසය" යන්නට ඉදිරිපත් වී ඇති නිර්වචනයක් ලියන්න.
ii. අතීත වෙළඳ ජනයා ලංකාව හැඳින් වූ නම් දෙකක් ලියන්න.
iii. ශ්‍රී ලංකාව ඉන්දියාවට ආසන්නයේ පිහිටා තිබීම නිසා ලද බලපෑම් දෙකක් කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 4+6+10=20)

**07** i. ලංකාවේ පිහිටි පැරණි වරායන් දෙකක් ලියන්න.
ii. ලක්දිවට පැමිණි ආර්ය කණ්ඩායම් තුනක් දක්වන්න.
iii. ලක්දිව මුල් ජනාවාස ආරම්භ වූ ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 4+6+10=20)

**08** i. අනුරාධපුරය අගනුවර ලෙස තෝරා ගත් පාලකයා දක්වන්න.
ii. ප්‍රාග් බෞද්ධ යුගයේ ලක්දිව පැවති ආගමික විශ්වාස තුනක් ලියන්න.
iii දුටුගැමුණු රජතුමා විසින් ශාසනයේ දියුණුවට ගනු ලැබූ ක්‍රියා මාර්ග විස්තර කරන්න.

(ලකුණු 4+6+10=20)

The National e-learning Portal for General Education